# කුරුලු පැටික්කි



නෙතිනි සෙයාරා කල්පගේ

# කුරුළු පැටික්කි

නෙතිනි සෙයාරා කල්පගේ



# කුරුළු පැටික්කී

---

© නෙතිනි සෙයාරා කල්පගේ

මහාමායා බාලිකා විදුහල
6 ශ්‍රේණිය G

2025.02.08

කතෘගේ වෙනත් කෘති

පුංචි මගේ කවි
යාලුවෝ
සුරංගනාවී
නීනී

ISBN 978 - 624 - 208 - 333- 9

# පිදුම

මා වැඩූ මාගේ දෙමාපියන්ට ද
ගුරු මෑණිවරුන්ට ද මෙම පොත
උපහාරයක් පිණිස
මෙම පොත පිළිගන්වමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියත් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

එකමත් එක්ක කාලෙක පුංචි කැලෑවක කුරුලු අම්මෙකුයි කුරුලු පැටියෙකුයි හිටියා.



මේ කුරුලු පැටියා හරිම හුරතල්.



දවසක් අම්මා කෑම සොයා ගෙන ගියා.කුරුළු පැටික්කි දුකෙන් අම්මා යනවා  බලන්  හිටියා.

කුරුළු අම්මා කිව්වා , පුතේ භායනක කලුවර කෑලෑවට යන්න එපා .මං එනකල් පරිස්සමෙන් ඉන්න



ඉතින් දවසක් කුරුලු පැටියා හිතුවා අම්ම යන්න එපා කිව්ව භයානක කැලෑවට යන්න ඕනේ කියලා.



අම්මා කෑම හොයන්නේ ගියපු වෙලාවක ඒ කුරුළු පැටියා හිමීට හිමීට ගියා අඳුරු කැලෑවට. ඔහොම අඳුරු කැලෑව ඉස්සරහට යනකොට එයාට බය හිතෙන්න ගත්තා.

සද්දයක් ඇහුනා.:



එයා හොඳටම බයේ වටපිට බැලුවා එයාට අම්මා මතක් උනා. හොඳටම බය හිතුනා. කවුරුවත් නෑවට පිටාවේ. අනේ මේ කුරුළු පැටියට කඳුළුත් එනවා එයාට අම්මා කියපු දේ මතක් වුන නිසා එයාට තව තවත් දුක හිතුනා.  එයා හොඳටම බය වෙලා දුවන්න පටන් ගත්තා. ඊට පස්සේ එයා හොඳට අතරමං උනා. පිටිපස්ස  බැලුවත් කැලේ ඉස්සරහ බැලුවත් කැලේ දෙපැත්ත බැලුවත් කැලේ අනේ දැන් මේ කුරුළු පැටියා තනි වෙලා .ආපහු  වටපිට බැලුවා අම්මා අම්මා කියලා  කෑගහන්න ගත්තා . ඈතින් එයාට පුතේ පුතේ කියලා  සද්දයක් ඇහුණා. එයා හිතුවා ඒ අම්මා කියලා. ඒක නිසා ඒ සද්දය ඇහුන පැත්ත ට දුවගෙන දුවගෙන දුවගෙන ගියා.

එයා දුවලා ගිහිල්ලා අම්මා බදා ගත්තා. අනේ අම්මා මට සමාවෙන්න මං ආපහු එහෙම වැඩක් කරන්නේ නෑ. මට අම්මා මතක් උනා අනේ මාව බේරගන්න ආවට අම්මට ගොඩාක් පිං. මගේ රත්තරන් මට සමාවෙන්න.



මගේ රත්තරන් පුතා මං පුතාට ගොඩාක් ආදරේ පුතාට මම ඒ වගේ නරක වැඩ කරන්න එපා කිව්වේ පුතාගේ ආරක්ෂාවට මගේ පුතා ආපහු ඒ වගේ නරක දේවල් කරන්න එපා මගේ රත්තරන් පුතාට මම ගොඩාක් ආදරෙයි.

අම්මටත් මං ගොඩාක් ආදරේ

මගේ රත්තරන් පුතා

මගේ රත්තරං අම්මා



දස මාසයක් කුසේ තබාලා
මැණිකක් සේ හදා වඩාලා
යහමගට හරවලා
අම්මා දුන්න ආදරයට වඳිමි
මම දොහොත් නගාලා



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්